දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල, ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේ අංකය )
எனதுஇல ) MH/TA/15/ST/SOR/01/2021
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2023.02. 09
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதாரஅமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ අංක : 01-42/2022

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා ජාතික රෝහල)
මහනුවර ජාතික රෝහලේ අධ්‍යක්ෂ
ශික්ෂණ රෝහල් සහ මහ රෝහල් අධ්‍යක්ෂවරුන්
රේඛීය අමාත්‍යාංශයට අයත් මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරිවරුන්
ඇතුලු සියලුම අදාල ආයතන ප්‍රධානීන් වෙත

**<u>වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් වාග් චිකිත්සක නිලධාරීන් නව බඳවා ගැනීම් පරිපාටියට අන්තර්ග්‍රහණය කිරීම.</u>**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයට අයත් වාග් චිකිත්සක නිලධාරීන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006ට අනුව සකස් කරනු ලැබූ නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව පහත සඳහන් පරිදි නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම සිදු කළ යුතුව ඇත.

| වර්තමාන ශ්‍රේණිය | නව ශ්‍රේණිය |
|---|---|
| II'ආ' | III |
| II'අ' | II |
| I | I |
| අධි | අධි |

02. නව බඳවා ගැනීමේ පරිපාටියට අන්තර්ග්‍රහණය කිරීමත් සමඟ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්විය යුතු ආකාරය හා එමගින් නිදහස් වීමට හිමිකම් ලබන ආකාරය පිළිබඳ තොරතුරු ඇමුණුම 01 මගින් දක්වා ඇත.

03. ඒ අනුව, මධ්‍යම රජයට අයත් රෝහල්වල හා ආයතනවල සේවයේ නියුතු නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා ඇමුණුම 02 හි සඳහන් අයදුම්පත විධිමත් පරිදි සම්පූර්ණ කර ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව පහත ලිපි ලේඛනයන්හි සහතික කරන ලද පිටපත්ද සමඟ අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 ලිපිනයට යොමුකළ යුතු වේ.

I. උප්පැන්න සහතිකය
II. ජාතික හැඳුනුම්පතෙහි පිටපත
III. විධිමත් පත්වීම් ලිපිය
IV. පත්වීම ස්ථිර කිරීමේ ලිපිය
V. II 'අ'ඛණ්ඩයටඋසස් කිරීමේ ලිපිය
VI. I ශ්‍රේණියට උසස් කිරීමේ ලිපිය
VII. නමෙහි වෙනසක් තිබේ නම් ඒ බව සනාථ කිරීම සඳහා දිව්රුම් ප්‍රකාශයක්/සනාථ කිරීමේ ලිපි

04. එසේම, මෙම චක්‍රලේඛයට අදාල විධිවිධාන පිළිබඳව අදාල සියලු පාර්ශව දැනුවත් කිරීමට ද කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

05. මෙම චක්‍රලේඛයෙන් ආවරණය නොවන කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සතු වන අතර, මෙම නිවේදනයේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්වෙන්නේය.

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත
ලේකම්.

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්

01. සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් - කා.දැ.ගැ.ස.
02. සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන් - කා.දැ.ගැ.ස.
03. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් - කා.දැ.ගැ.ස.

ඇමුණුම 01

කාර්යක්ෂමතා කඩඉම් විභාගය

| පැරණි බඳවාගැනීම් පටිපාටිය | නව බඳවාගැනීම් පරිපාටිය |
|---|---|
| **(1)** පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• කාර්යාල ක්‍රම<br>• මුදල් රෙගුලාසි<br>• දෙපාර්තමේන්තු රෙගුලාසි | **(1)** පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති<br>• මුදල් රෙගුලාසි |
| **(2)** දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• විෂයය බද්ධ කරුණු | (2) දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• ආයතන සංග්‍රහය<br>• මුදල් රෙගුලාසි<br>• විෂයානුබද්ධ (ලිඛිත, වාචික, ප්‍රායෝගික) |
| (3) තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය<br>• කාර්ය විශේෂිත දැනුම | (3) තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• විෂයානුබද්ධ - ව්‍යුහගත රචනා (කාර්ය විශේෂිත දැනුම) |

(අ) පැරණි බඳවා ගැනීමේ පරිපාටියේ කාර්යාල ක්‍රම හා මුදල් රෙගුලාසි යන විෂයන් දෙක සමත් නිලධාරීන් පැරණි බඳවා ගැනීමේ පරිපාටි අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙහි දෙපාර්තමේන්තු රෙගුලාසි ප්‍රශ්න පත්‍රය සමත් වීමෙන් නිදහස් කරනු ලැබේ.

(ආ) පැරණි බඳවා ගැනීමේ පරිපාටියේ කාර්යාල ක්‍රම හා මුදල් රෙගුලාසි යන විෂයන් දෙකෙන් එකක් පමණක් සමත් නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටියේ කාර්යක්ෂමතා කඩඉම යටතේ අනුමත අනුරූපී විෂය සමත් වීමෙන් පසු පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කළා සේ සලකා නිදහස් කරනු ලැබේ.

(ඇ) පැරණි බඳවා ගැනීමේ පරිපාටිය අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂයෙන් සමත් නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි යන ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.

(ඈ) පැරණි බඳවා ගැනීමේ පරිපාටිය අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් අසමත් නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව ප්‍රශ්න පත්‍ර තුන සඳහාම පෙනී සිටිය යුතුය.

(ඉ) ඉහත සඳහන් පරිදි සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වෙනස් වුවද සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාල කාලසීමාව වෙනස් නොවේ.

ඇමුණුම 02

**වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් වාග් චිකිත්සක නිලධාරීන් නව බඳවා ගැනීම් පරිපාටියට අන්තර්ග්‍රහණය කිරීම.**

1. නිලධාරියාගේ සම්පූර්ණ නම : ......................................................................................................
2. තනතුර :......................................................................................................
3. ආයතනය :......................................................................................................
4. ජාතික හැඳුනුම්පත් අංකය :......................................................................................................
5. මුල් පත්වීම් දිනය :......................................................................................................
6. වර්තමාන ශ්‍රේණියට උසස් වූ දිනය :......................................................................................................
7. 2016.01.01 දිනට අදාල ශ්‍රේණිය :......................................................................................................

ඉහත අංක 01 සිට 07 දක්වා සඳහන් විස්තර මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය : .................................                    ................................................

නිලධාරියාගේ අත්සන

---

ඉහත නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව අයදුම්පතේ 1 සිට 7 දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බව මෙයින් සහතික කරමි.

...............................                    ................................................

දිනය                    විෂය භාර නිලධාරියාගේ අත්සන

---

ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

වාග් චිකිත්සක තනතුර දරණ ......................................................................... මයා/මිය/මෙය නව බඳවා ගැනීමේ පරිපාටියට අනුව III / II / I / අධි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි/නිර්දේශ නොකරමි.

...............................                    ..........................................................................

දිනය                    ආයතන ප්‍රධානියාගේ අත්සන හා නම සහිත නිල මුද්‍රාව